# ශ්‍රී ලංකාවේ කුඹල් කුලය ආශ්‍රිත රැකියා වෙනස් වීම පිළිබඳ සමාජවිද්‍යාත්මක අධ්‍යයනයක්

ඩබ්.එම්.එන්.එස්. විජේකෝන් - සමාජවිද්‍යා අධ්‍යයනාංශය

අතීතයට වඩා වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ කුල ක්‍රමය සාපේක්ෂ වශයෙන් ලිහිල් වූ ආයතනයක් ලෙස සලකනු ලැබුවද තවමත් මිනිසාගේ විඥානයත් සමඟ මෙම කුල ක්‍රමය බැඳී පවතී. නමුත් අතීතයේ කුලයට බද්ධව පැවති වෘත්තිය අද වන විට විවිධ කරුණු කාරණා පදනම් කරගෙන වෙනසකට ලක් වී ඇත. නමුත් සමහර කුලවල එය ඔවුන්ටම සුවිශේෂ වූ වෘත්තියක් ලෙස බැඳී පවතී. කුඹල් කුලය හා බැඳි වෘත්තිය වෙනස් වීමට බලපාන ලද සාධක කවරේ ද? යන පර්යේෂණ ගැටලුවට අදාළව මෙම අධ්‍යයනය සිදු කර ඇත. පාරම්පරිකව කුඹල් කර්මාන්තයේ නිරත වන ප්‍රජාවක් ජීවත් වන පාලුගම ගම්මානය පර්යේෂණ ක්ෂේත්‍රය ලෙස ඇසුරු කරගෙනය. මෙම අධ්‍යයනය සඳහා මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරන ලද අතර ගුණාත්මක දත්ත හා ප්‍රමාණාත්මක දත්ත රැස් කිරීමද සිදු කරන ලද හෙයින් ප්‍රධාන වශයෙන් සම්මුඛ සාකච්ඡා යටතේ එන සම්මුඛ සාකච්ඡා ක්‍රමයත් සමීක්ෂණ ක්‍රමය යටතේ එන ප්‍රශ්නාවලි ක්‍රමයත් මෙන්ම නිරීක්ෂණ ක්‍රමය යටතේ එන සෘජු නිරීක්ෂණ ක්‍රමයත් ප්‍රාථමික දත්ත රැස් කිරීමට භාවිත කරන ලදි. නියැදිය තෝරා ගැනීම පිළිබඳව අවධානය යොමු කිරීමේදී ප්‍රශ්නාවලි ක්‍රමය යටතේ ගැඹුරු සම්මුඛ සාකච්ඡා සිදු කිරීමට වඩාත් සුදුසු පුද්ගලයන් තෝරා ගැනීමක් සිදු කරනු ලැබූ අතර මෙහි දී ප්‍රධාන වශයෙන්ම අරමුණු සහගත නියැදි ක්‍රමය භාවිත කරන ලදී. ඒ අනුව ප්‍රශ්නාවලි ක්‍රමය යටතේ ප්‍රතිචාර දක්වන්නන් 53 දෙනෙකුගේ ප්‍රජාවිද්‍යාත්මක දත්ත මෙන්ම ගැඹුරු සම්මුඛ සාකච්ඡා යටතේ ප්‍රතිචාර දක්වන්නන් 20 දෙනෙකුගෙන් දත්ත රැස් කරන ලදී. දත්ත විශ්ලේෂණය සඳහා මූලික වශයෙන් තේමා අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමයත් ආඛ්‍යාන විශ්ලේෂණයත් භාවිතයට ගන්නා ලදි. කුඹල් කුලය ආශ්‍රතව රැකියාව වෙනස් වීමට අධ්‍යාපනික, සමාජ, දේශපාලනික හා ආර්ථික වශයෙන් ප්‍රබල බලපෑමක් සිදු වී ඇත.

*ප්‍රමුඛ පද: කුලය, කුඹල් කර්මාන්තය, ආර්ථිකය, අධ්‍යාපනය, සමාජය*